# වෘද්ධත්‍රයයෙහි දැක්වෙන "දෛව ව්‍යපාශ්‍රය" චිකිත්සාව සහ ශ්‍රී ලාංකික " ශාන්තිකර්ම" පිළිබඳ ඇගයීමක්

කොළඹ විශ්ව විද්‍යාලයීය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ
දර්ශණපති (ආයුර්වේද) පශ්චාත් උපාධිය සඳහා
ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධනයයි.


වෛද්‍ය එච්. ඒ. ඩී. එස්. ශ්‍රියාලතා

මෞලික සිද්ධාන්ත අධ්‍යයනාංශය
දේශීය වෛද්‍ය විද්‍යායතනය
කොළඹ විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකාව



2000 නොවැම්බර්

එම්ෆිල් 96 /54

## සාරාංශය

වෘද්ධත්‍රය නමින් හැඳින්වෙන්නේ ආයුර්වේද ශාස්ත්‍රය පිළිබඳව ලියවී ඇති ඉපැරණිම ග්‍රන්ථ තුනක් වන චරක සංහිතාව, සුශ්‍රැත සංහිතාව, හා අෂ්ටාංගහෘදය නැමැති සංහිතායි. 'දෛව ව්‍යපාශ්‍රය' විග්‍රහ කිරීමේදී 'දෛව' යන්නෙන් දේව, ශුද්ධ වූ ආදී අර්ථද, 'ව්‍යපාශ්‍ර' යන්නෙන් උපාය කර ගැනීම, පිහිට කර ගැනීම යන අරුත්ද දේ. මෙහිදී දෛව ව්‍යපාශ්‍රය චිකිත්සාව යන්නෙන් දෙවියන් පිහිට කොට ගෙන නැතහොත් දෙවියන් සතුටු කර රෝග සුව කිරීම අදහස් කෙරේ. ඒ අනුව වෘද්ධත්‍රයේ මන්ත්‍ර, ඖෂධ ධාරණය, මණි ධාරණය, මංගල ක්‍රියා, බලි දානය, උපහාරය, හෝමය, නියමය, ප්‍රායශ්චිත්තය, උපවාසය, දානය, ස්වස්ත්‍යයනය, ප්‍රණිපාත හා තීර්තගමන නමින් ක්‍රමයයන් රෝග ව්‍යපශමන කිරීම සඳහා දක්වා ඇත.[1]

වා, පිත්, සෙම් ආදී ස්වභාවික දෝෂ උදෙසාද, දෙව් දෝෂ, ග්‍රහ දෝෂ, යක්ෂ දෝෂ, ප්‍රේත දෝෂ, වස්දොස් ආදී අමනුෂ්‍ය දෝෂ උදෙසාද, කෙරෙන කර්ම ශාන්ති කර්ම ලෙස හැඳින්විය හැක. සිංහල ජන විශ්වාසයට අනුව රෝගී බවට හේතු වන ප්‍රධාන දෝෂ 2ක් ඇත. එනම් කර්ම දෝෂ හා ග්‍රහ දෝෂයි. මෙම දෝෂ දෙවර්ගයටම අයත් වන්නේ ඉහත කී ස්වභාවික දෝෂ හා අමනුෂ්‍ය දෝෂයි. ශ්‍රී ලාංකිකයින් ලෙඩදුක් නිවාරනය සඳහා යොදා ගන්නාවූ ශාන්තිකර්ම අතර කොහොඹ කංකාරිය, දෙවොල්මඩු ශාන්ති කර්මය, රටයකුම, සූනියන් කැපිල්ල, සන්නියකුම ආදිය ප්‍රධාන තැනක් ගනී. ග්‍රහ දෝෂ නිවාරනය සඳහා ගම්මඩු, පූනාමඩු ආදී යාග පවත්වති. මෙම ශාන්ති කර්මයන්හිදී මූලික වශයෙන් බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයේ ආධිපත්‍ය පිළිගැනීම විශේෂත්වයයි.

---

ච.චි. 8/74

කොහොඹා කංකාරිය පවත්වන ප්‍රධාන ප්‍රදේශ වනුයේ සතර කෝරළය, උඩු නුවර, යටි නුවර, හාරිස්පත්තුව, තුම්පනේ, සහ දුම්බර උඩ පලාතය. මෙහිදී පුද ලබන දෙවිවරු වනුයේ කළුකුමාර, හිරුගල් බණ්ඩාර, කොහොඹ දෙවිවරු තිදෙනා, වලියක්, වීරමුණ්ඩ, කන්දෙ බණ්ඩාර, පත්තිනි, ඊශ්වර ආදීන්ය. ධන ධාන්‍ය, ගව මහිෂාදී භවභෝග වැඩි දියුණු කිරීම, රෝගාබාධ සුවකිරීම, ගමකට හෝ රටටම පැමිණ ඇති ව්‍යසනයන්ගෙන් මිදීම හා සශ්‍රීක බව හෙවත් සෞභාග්‍ය උදාකර ගැනීම මෙහි මුඛ්‍ය පරමාර්ථ වේ. මෙහි පූජාවිධි 78 ක් වේ. ඒවා කංකාරිය දිනට පෙර චාරිත්‍ර ලෙසත්, එදින පෙරයම, මැදියම, අලුයම චාරිත්‍ර ලෙසත් පවත්වනු ලැබේ.

පහත රට ශාන්තිකර්මයක් වූ දෙවොල් මඩු ශාන්තිකර්මය හොරණ, බෙන්තර, ගාල්ල, අම්බලන්ගොඩ ආදී පලාත්වල වඩාත් පැවැත්වේ. මෙහි මුඛ්‍ය පරමාර්ථ වනුයේ ලෙඩ රෝග සුව කිරීම, සශ්‍රීකත්වය ලබා දීම, හා ගමට රටට ශාන්තියක් ලභාකර ගැනීම ආදියයි. මෙහි පූජා විධි 22 ක් පැවැත්වේ.

රටයකුම ශාන්තිකර්මය රිද්දියාගය නමින්ද හැඳින්වේ. බෙන්තර, මාතර, ගම්පහ ප්‍රදේශ වල බොහෝ විට දක්නට ලැබේ. දරුවන් නැති කාන්තාවන්ට දරුඵල ලබා දීමටද, ගර්භ සංරක්ෂණය සඳහාද, මනාව දරුවන් ලබන කතුන් කෙරෙහිද, ගර්භ පතනය වන අයටද මෙම රටයකුම ශාන්තිකර්මය කරනු ලැබේ.

ලක්දිව ශාන්තිකර්ම උදෙසා කරනු ලබන වත් පිලිවෙත් හා ක්‍රම ආදිය 'පූජා රටාව' නමින් හැඳින්වේ. ඒවා පලාත් අනුවද ඒ ඒ ශාන්තිකර්ම අනුවද නොයෙකුත් වෙනස්කම් දක්වයි. මේවායේ කුමන වෙනස්කම් තිබුණද මූලික පරමාර්ථය ආතුරයා සුවපත් කිරීමයි. ලක්දිව පවතින ප්‍රධාන ශාන්ති කර්මයන් ඒ ඒ ප්‍රදේශ අනුව ගැනෙන විට, කොහොඹ කංකාරිය උඩරට ශාන්ති කර්මයක් ලෙසද, දෙවොල් මඩු, රටයකුම, දහ අට සන්නිය පහත රට ශාන්තිකර්මයන් ලෙසද පහන් මඩු, කිරිමඩු ශාන්ති කර්මයන් සබරගමු ප්‍රදේශයට අයත් ලෙසද ගැනෙන අතර බලි යාගය පොදු ශාන්තිකර්මයක් ලෙසද ගැනේ. මීට අමතරව පිරිත් කීම්, බෝධි පූජා, දානමාන............... ආදී සාමාන්‍ය ශාන්තිකර්මද බහුලව සිදුකෙරේ. ඉහත සඳහන් කරුණු විමර්ශනය කිරීමේදී දෛව ව්‍යපාශ්‍රය චිකිත්සාව පොදු ජනයා අතර ප්‍රචලිත පිළියම් ක්‍රමයක් ලෙස සැලකිය හැක.

පුද්ගල රෝග නිවාරනයේදී දෛවව්‍යපාශ්‍රය චිකිත්සාව සහ ශාන්තිකර්ම ප්‍රතිකාර
ුමය අතර සහසම්බන්ධතාවය බැලූ කල මෙම දෙකින්ම කරනු ලබන්නේ දෙවියන් සතුටු කර එමගින්
නිස් මනස සතුටට පත්කර රෝග සුවකිරීම බව පෙනේ. මෙම දෙකින්ම කරනු ලබන ක්‍රියා බොහෝ
රට සමානය. මෙමගින් සුවවන රෝගද බොහෝ දුරට සමාන බවක් පෙන්නුම් කරයි. දෛව
‍යපාශ්‍ර ක්‍රියාකාරකම් මෙන්ම ශාන්තිකර්ම ක්‍රියාකාරකම් වලද යම් යම් සමානතා දක්නට ලැබේ.
දා :- මන්ත්‍ර මැතිරීම, වඩිග පටුන වැනි නැටුම්. මේවා අනුව ලක්දිව ශාන්තිකර්ම කෙරෙහි ඉන්දීය
භාෂය ලබා ඇති බැව් යම් යම් අවස්ථා වලදී දැකිය හැකිය. එනමුදු පිරිත් කීම්, බෝධිපූජා
ැවැත්වීම් ආදී ශාන්ති කර්මයන්හිදී බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයට මුල්තැන දී ක්‍රියා කිරීම
ිසා එම ශාන්ති කර්මයන් ඉන්දීය ආභාෂයක් නොලැබූ හුදෙක් ශ්‍රී ලාංකිකයනටම ආවේනික වූ
ාන්තිකර්ම ලෙස සැලකිය හැක.

පුද්ගලයාගේ ජීවිතය කෙරෙහි මනස හා සිත සැම අතින්ම බලපාන බවත් මූලික
වන බවත්, බොහෝ රෝගයන්ට මනස කාරණා වන බවත් පර්යේෂණ මගින් ඔප්පු වී ඇත.
ුදාහරණ ලෙස යම් භයානක දර්ශනයක් හේතු කොට ගෙන පුද්ගලයාගේ මනස විකෘති විය හැක.
ඔහුගේ කිපියාවූ ත්‍රිදෝෂ හේතු කොට ගෙන රක්තය දූෂිත වීමෙන් ප්‍රතිශක්තියද, බලයද දුබල වීමට
හැකියාව ඇත. මෙබඳු හේතු කාරනා මුල් වීමෙන් දූෂිත වූ මනස ප්‍රකෘති තත්තවයට පත් කිරීම
අත්‍යාවශ්‍යවේ. ශාන්තිකර්මයන්ගෙන් කරනු ලබන්නේ එම විකෘති වූ මනස ප්‍රකෘති තත්තවයට පත්
කිරීමයි. රෝගියා තුල ශ්‍රද්ධාව, භක්තිය, සතුට, විශ්වාසය, සොම්නස, ආශාව වැඩි දියුණු කිරීම
මෙම ශාන්තිකර්ම මගින් සිදුවේ.

පිරිත් දේශනා, බෝධිපූජා, දන්දීම, දෙවියන් යැදීම, අං කෙළිය, පොල් කෙළි, බහිරව
පූජා, දෙහි කැපීම, නූල් බැඳීම, යන්ත්‍ර, මන්ත්‍ර, සෞඛ්‍ය පුරුදු, දින චර්‍යා හා වන්දනා ගමන් ආදී
ශාන්තිකර්මයන්ගෙන් උත්පාදනය වන ආශිර්වාදාත්මක අර්ථ ග්‍රහනයන්ගෙන් සමන්විත යහපත්
ශබ්ද තරංග, දශින, විවිධ ගන්ධ, රස, ස්පර්ශ ආදියෙන් පුද්ගල සිත සුවපත් වේ. ලේ පිරිසිදු වී,
ප්‍රතිශක්තිකරණය වැඩි දියුණු වීමට හේතු විය හැක. ඒ අනුව ඇස, කන, නාසය, දිව, ශරීරය යන
පංච ඉන්ද්‍රියන් ඊට අනුරූපී වූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යනාදියේ ක්‍රියාකාරීත්වය හේතු කොට
ගෙන ඒ ඒ ශාන්තිකර්මයන්, ඒ ඒ රෝග සුව කිරීමට ඉවහල් වන බැව් පැහැදිලි වේ.

ශරීරයේ නියමුවා මනසයි. එය පාලනය කරන්නේත් දියුණුව හෝ පිරිහීම ඇති කරන්නේත් මනසෙනි. මෙසේ කරන්නේ සිතුවිලි මගිනි. ප්‍රධාන වශයෙන් සිතුවිලි කොටස් දෙකකි. ඒ යහපත් හා අයහපත් සිතුවිලි යනුවෙනි. ජීවිතයේ සුභසිද්ධියට යහපත් සිතුවිලිද පිරිහීමට අයහපත් සිතුවිලිද හේතුවේ. ශාරීරික නිරෝගි බවටද යහපත් සිතුවිලි වැදගත් වේ. අමනුෂ්‍ය දෝෂ හා ස්වභාවික දෝෂ අයහපත් සිතුවිලි වලට හේතු වන අතර රෝගී බව ඇති කරයි. දෛවව්‍යපාශ්‍රය චිකිත්සාව මගින් මනස තුල යහපත් සිතුවිලි ඇතිකර රෝග සමනය කිරීම ඇති කෙරේ.

යම්කිසි සංඥාවක් ඒ ඒ සංඥාවේ ස්වභාවය අනුව එනම් ආලෝකය, ශබ්දය, ගන්ධය, රස හා ස්පර්ශය අනුව ඇස, කන, නාසය, දිව හා ශරීරය යනාදි අදාල ඉන්ද්‍රියන් මගින් ග්‍රහනය කර මනසට යොමු කරයි. මනසෙහිදී මෙම සිතුවිලි විශ්ලේෂණයට ලක්කර ක්‍රියාවට නංවයි. මොලයට ගෙන ගිය සංඥා ක්‍රියාවට නැංවීම සඳහා ස්නායු පද්ධතියක් ඇත. කායික ක්‍රියාකරන ස්නායු කාය ද්වාර නමින්ද වාචික ක්‍රියා කරන ඉන්ද්‍රිය පද්ධතිය වාචික ද්වාර නමින්ද හැඳින්වේ.[1] යම්කිසි සංවේදනයක් ස්නායු පද්ධතිය තුලින් ගමන් කරන විට ග්‍රන්ථිමය ස්‍රාවයක් නිකුත්වේ. මෙම ස්‍රාවය මගින් මාංශපේශි වල ක්‍රියා හා වෙනත් ක්‍රියාවලි බොහොමයක් සිදුවේ.

ශාන්තිකර්මයන් තුලින් ඇතිවන්නාවූ සිතේ විශ්වාසය, නිවැරදි සිහි කල්පනාව, අකුසලට බියවීම, නිවැරදි කථා, නිවැරදි ක්‍රියා, නිවැරදි ජීවන පැවැත්ම හා ප්‍රීතිය වැනි යහපත් සිතුවිලි වලින් මනසේ ක්‍රියාවලි නිසිපරිදි සිදුවී යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට උපකාරී වේ. යහපත් සිතුවිලි ක්‍රියාදාමයන් තුලින් සංවේදීව උත්පාදනය වන්නාවූ මානසික බලපෑම් චේතනාත්මක ශරීර ක්‍රියාවන්ට හා කථාවන්ට හේතුවනවා පමණක් නොව උද්යෝගිබව, කිකරු බව, නිපුනභාවය ආදියද යමකු තුල ඇතිවන්නට හේතු වනවා ඇත. ස්වසන ස්වභාවය, දහදිය දැමීම, කඳුළු ගැලීම, කම්මුල් රතුවීම, මාංශ පේශීන් චලනය වීම ආදී ක්‍රියාවල පැවැත්මටද සිතුවිලි ක්‍රියාදාමය හේතු වේ. යහපත් සිතුවිලි ශාරීරික හා මානසික සෞඛ්‍යයට බලපාන්නේ මේ නිසයි.

---

| | | |
|---|---|---|
| Jayasuriya W.F. ; | The psychology & Philosophy ; of Buddhism P. 46. | Y.M.B.A. Press Borella. |

මිනිස් සිතකින් සිතකට පණිවුඩයාම පමණක් නොව ගහ කොළ හා අප අතරද සියුම් බැඳීම් ඇති බව විද්‍යාඥයන් පර්යේෂණ මගින් ඔප්පු කර ඇත. එමෙන්ම සිතේ ශක්තියෙන් භෞතික ද්‍රව්‍යයන්ට පවා බලපෑම් කළ හැකි බවද, අප ශරීරයෙන් කිරන ශක්තියක් විහිදෙන බවද, යහපත් සිතුවිලි වලින් යහපත් කිරණත්, අයහපත් සිතුවිලි වලින් අයහපත් කිරණත් විහිදෙන බවද විද්‍යාඥයන් වැඩිදුරටත් පෙන්වා දී ඇත. එමෙන්ම මෙකී කිරණයන්ට වෙනත් ජීව සෛලයන්ට බලපෑම් කළහැකි බව ඔවුහු පවසති. වැඩිදුරටත් කරුණු පෙන්වා දෙන විද්‍යාඥයෝ පයට පෑගෙන තණකොළ ගහේ සිට ඈත එපිට සඳ, හිරු, තරු ආදී ග්‍රහයන් මගින් අපකරා එන සෑම ශක්ති විශේෂයක්ම අප ශරීරයට බලපාන බව ඔප්පු කර ඇත. ශාන්තිකර්මයන් තුල ගැබ් වී ඇති සමහර ඇදහිලි හා විශ්වාස ගොඩනැගී ඇත්තේ මෙම ශක්ති කිරණ පදනම් කරගෙනය.

රෝග සමනය උදෙසාම නිර්මානය කළ දෛව ව්‍යපාශ්‍රය චිකිත්සා සහ ශාන්තිකර්ම චිකිත්සා තුලින් බිහිවන රූප ඇසෙන්ද, ශබ්ද කනෙන්ද, ගන්ධ නාසයෙන්ද, රස දිවෙන්ද, ස්පර්ශය හමෙන්ද ශරීරය වෙත ඇතුල් වී සංඥා වහා ස්නායු පථය මගින් මොලය කරා ගෙන යයි. ඉන් යහපත් සිතුවිලි ධාරාවක් ඇතිවේ. මෙම සිතුවිලි ධාරාව මොලයේදී විශ්ලේෂනයට භාජනය වී මානසික හෝ ශාරීරික ක්‍රියාවන් උදෙසා චේෂ්ටා පථය මගින් අදාල ඒ ඒ ඉන්ද්‍රියන් වෙත යොමු කරයි. මෙකී අවසාන ක්‍රියාවට යොමු වීමට ප්‍රථම යාන්ත්‍රිකවූද, විද්‍යුත්වූද, රසායනිකවූද, උෂ්ණාතාපිකවූද, ක්‍රියාවලියකට භාජනය වේ. ඉන්පසු ඒ ඒ ඉන්ද්‍රියන් වෙත යොමු වී රෝග ව්‍යපසමනය උදෙසා ක්‍රියා කේරෙන බැව් මෙතෙක් කළ විමසුමට අනුව උපකල්පනය කළ හැක.